# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කැලණිවැලි (KV) චෙක් රේල්ඩ් මාර්ගය සඳහා EN45E1 රේල් පීලි වලට ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර 4,000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය.**

## IFB අංක SRS/F.7880

1. කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කැලණි වැලි මාර්ගය සඳහා චෙක් රේල් මාර්ගය (Check Railed Track) සඳහා EN45E1 රේල් පීලි වලට ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර 4,000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින් / සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
3. අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට, 2022.09.26 දින සිට 2022.10.20 දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයේදී වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත්, ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | |
|---|---|
| **දුරකථන අංක** | **: 94(11)2438078 හෝ 94(11)2436818** |
| **ෆැක්ස් අංකය** | **: 94(11)2432044** |
| **විද්‍යුත් තැපැල** | **: srs.slr@gmail.com** |
| **වෙබ් අඩවිය** | **: www.railway.gov.lk** |

4. ලංසුකරු, පසුගිය වසර පහ (05) ඇතුළත ශ්‍රී ලංකා දුම්රිය සේවයට කොන්ක්‍රීට් සිල්පර 5,000 ට වැඩි සංඛ්‍යාවක් හෝ පෙරැදි (Pre-stressed) කොන්ක්‍රීට් බාල්ක රු. මිලියන 500 ට වැඩි අගයකට සපයා තිබිය යුතුය. නැතහොත් පෙරැදි කොන්ක්‍රීට් කණු රු. මිලියන 500 කට වැඩි අගයකට සපයා තිබිය යුතුය. ඉන්වොයිස් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
5. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාල ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 27,500/- ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2022.09.26 දින සිට 2022.10.20 දින ප.ව. 3.00 තෙක් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්ට ලබාගත හැකිය.
6. සියලුම ලංසු සමග ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණ මුදල රු. 1,700,000.00 විය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.
7. ලංසු 2022.10.21 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ විගසම ලංසු විවෘත කෙරෙන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි විය හැකිය. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංක : SRS/F.7880**

A.M.U.S. WIJEWARD...
Procurement Officer (Covering)
Railways Stores Department,
Sri Lanka Railw...
Colombo 10.

2022.09.26 සඳුදා - 'දිනමිණ'

(පිටු අංක - 12)